සංසාරයේ පියසටහන්

මිනිසුන් මිය යෑමෙන් පසුව දෙවියන් ලෙස ද ඉපිදිය හැකි ය යන දැනුම කෙසේ ඇති විණි දැයි නිශ්චිතව කිව නො හැකි ය. එසේ වුවත් ඒ පිළිබඳ විවිධ අනුමාන ඇති කරගැනීමට අපට බාධාවක් නො වේ. ද්‍රව්‍යවලට, සතුන්ට, ගුණවලට දේවත්ව ආරෝපණය කිරීම එකකි. මියගිය නෑයන් ආදීන් දෙවියන් ලෙස ඉපිදිය හැකි ය යන දැනුම ඇතිකර ගැනීම තවත් එකකි. එහෙත් එයින් කියැවෙන්නේ ඒ දෙක අතර සම්බන්ධයක් නැති බව නො වේ.

සංසාරය පිළිබඳ සංකල්පයේ මුල් අවස්ථාව කිසිවකු මිය යෑමෙන් පසුව එක් වරක්වත් වෙනත් භවයක (ආත්මයක) ඉපදෙන්නේ ය යන්න විය යුතු ය. ලොවේ ප්‍රධාන ආගම් ලෙස හැඳින්වෙන ආගම්වල මිනිසකු මිය යෑමෙන් පසු අඩුම තරමින් එක්වරක්වත් ඉපදෙන්නේ ය යන අදහස වෙයි. මිනිසකු මිය යෑමෙන් පසුව ස්වර්ගයට හෝ අපායට හෝ යන්නේ ය යන්නෙහි තේරුම ඒ තැනැත්තා අඩුම තරමින් ස්වර්ගයේ හෝ අපායේ හෝ ඉපදෙන බව ය.

මේ අදහස කිනම් සංස්කෘතීන්හි ඇතිවිණි ද යන්න සොයා බැලීම වැදගත් වනු ඇත. කිසිවකු එම ව්‍යාපෘතිය, එනම් මිනිසකු මිය යෑමෙන් පසුව අඩුම තරමින් එක් වරක් ඉපදෙන්නේ ය යන අදහස කෙසේ කවදා කිනම් සංස්කෘතීන්හි ඇතිවිණි දැයි සොයා බැලීම සංස්කෘතියෙන් සංස්කෘතියට දැනුම අවශෝෂණය කෙරෙන්නේ කෙසේ දැයි සොයා බලන්නන්ට වැදගත් වෙයි.

මිය යෑමෙන් පසුව සියලු සත්වයන් නැවත අඩුම තරමින් එක් වරක් ඉපදෙන්නේ ය යන අදහස ඇතිවීමට පෙර සියලු මිනිසුන් අඩුම තරමින් එක් වරක්වත් ඉපදෙන්නේ ය යන අදහස ඇතිවිණි යැයි සිතිය හැකි ය. බෞද්ධ සංස්කෘතීන්හි හැරුණු විට සියලු සත්වයන් එකම මට්ටමක ලා සැලකෙන්නේ සමහරවිට ජෛන සංස්කෘතීන්හි විය යැකි ය. අද දියුණු යැයි කියන බොහෝ රටවල සංස්කෘතීන්හි අනෙක් සත්තු මිනිසුන් හා සම මට්ටමෙහි ලා නො සැළකෙති.

ඒ කෙසේ වෙතත් සියලු මිනිසුන් මිය යෑමෙන් පසු එක් වරක්වත් ඉපදෙන්නේ ය යන්න ඇතැම් මිනිසුන් මිය යෑමෙන් පසුව එක් වරක්වත් මිය යන්නේ ය යන්නෙහි සාධාරනීකරණයක් විය යුතු යැයි සිතමි. එක් වරම සියලු මිනිසුන් මිය යෑමෙන් පසුව අඩුම තරමින් එක් වරක්වත් ඉපදෙන්නේය යන අදහස ඇතිවීමට ද ඉඩක් නැත්තේ නො වේ. එහෙත් ඒ සඳහා වූ සම්භාවිතාව ඇතැම් මිනිසුන් මිය යෑමෙන් පසුව අඩුම තරමින් එක් වරක්වත් ඉපදෙන්නේ ය යන අදහස ඇතිවීමට ඇති සම්භාවිතාවට වඩා අඩුවිය යුතු යැයි සිතමි.

සියලු මිනිසුන් මිය යෑමෙන් පසුව එක් වරක්වත් ඉපදෙන්නේ ය යන අදහස ඇතිවීමෙන් පසුව මිනිසුන් වෙනත් ආත්මවල විවිධ අවස්ථාවල ඉපිදිය හැකි ය යන අදහස ඇතිවන්නට ඇත. ඉන් පසුව මිනිසුන්ට මරණයෙන් පසුව වෙනත් සතුන් ලෙස ඉපිදිය හැකි නම් සතුන්ට ද මරණයෙන් පසුව මිනිසුන් ලෙස ඉපිදිය හැකි බව තේරුම් ගැනීමටත් මැරි මැරී ඉපදීම සංසාරය ලෙස සංකල්පගත කිරීමටත් තරමක කාලයක් ගතවන්නට ඇත. එහෙත් මේ සංසාරය පිළිබඳ සංකල්පය පූර්ණ අර්ථයකින් ප්‍රකාශ වී ඇත්තේ බෞද්ධ සංස්කෘතීන්හි විය යුතු ය. ඇතැම් හින්දූන්ට අනුව සංසාරයේ සැරිසරන සත්වයනට මිනිස් ආත්මයක් ලබාගත හැක්කේ එක් වරක් පමණකි.

ඒ කෙසේ වෙතත් ඉහත දැක්වූයේ සංසාරය පිළිබඳ සංකල්පයට ළඟාවිය හැකි එක් ක්‍රමයක් පමණකි. එසේත් නැතහොත් මිය යෑමෙන් පසු ඇතැමුන් නැවත උපදින්නේය යන දැනමෙහි සිට සංසාරය යන සංකල්පය දක්වා අදහස් හා සංකල්ප විකාශය වූ ආකාරය ය. එහෙත් ඒ සඳහා වූ එකම ක්‍රමය යැයි නිගමනය නොකළ යුතු ය. ඉහත දක්වා ඇත්තේ පංචේන්ද්‍රිය හා මනස පමණක් යොදාගනිමින් සීමිත අත්දැකීම් මත පදනම් වෙමින් සංසාරය නම් සංකල්පය වෙතට පැමිණියේ යැයි සිතිය හැකි ක්‍රමයකි. එයට ප්‍රේත ආදී සංකල්ප ද එවැනි ම සීමිත වූ අත්දැකීම් මත පදනම් ව එකතුවන්නට ඇත. සංසාරයේ ඇතැම් ආත්මවල ප්‍රේත හා වෙනත් එවැනි ලෝකවල ඉපදෙන්නට හැකි බව ද මිනිසුන් තේරුම් ගන්නට ඇත.

සංසාරය යන සංකල්පය තෙක් අදහස් විකාශය වීමේ දී එක් අවස්ථාවක් වන විට ධ්‍යාන උපදවා පංචෙන්ද්‍රිය ඇසුරු නොකර අවශ්‍ය පරිදි මනසින් ලෝකය දැකීමට හැකි වූ අය බිහිවන්නට ඇත. මේ අයගෙන් සමහර දෙනකුට සත්වයන්ගේ පෙර ආත්ම (අනාත්මය එකල නොවූ බව පැහැදිලි විය යුතු ය) මනසින් දැකීමට හැකිවන්නට ඇත. ඔවුන්ට වැඩි අපහසුවක් නැතිව ම සංගත ව සංසාරය යන සංකල්පය ගොඩනගා ගැනීමට

© Prof. Nalin De Silva

හැකියාව තිබෙන්නට ඇත. එවැනි පිරිස් කලින් සඳහන් කළ ක්‍රමය ඔස්සේ දිගටම නොගොස් සංසාරය යන සංකල්පය කරා කෙටි මාවතකින් පැමිණෙන්නට ඇතැයි සිතිය හැකි ය.

ඇතැම් විට ධ්‍යාන උපදවා පංචේන්ද්‍රියන්ගේ ආධාරයෙන් තොරව මනසින් අවශ්‍ය පරිදි ලෝකය දැකි අය සත්වයන් වෙනත් භවවල, ඔවුන්ට අනුව ආත්මවල ඉපදෙන බව, මැරී මැරී ඉපදෙන බව, දැනගන්නට ඇත. ඒ එසේ වී නම් ඔවුන්ට සංසාරය යන සංකල්පය ඉතා ඉක්මණින්ම නිර්මාණය කරගැනීමට හැකියාවක් තිබූ බව පැහැදිලි විය යුතු ය. බොහෝ විට සංසාරය යන සංකල්පය නිර්මාණය කිරීමේ දී ධ්‍යානලාභීන් විශේෂ කාර්යභාරයක් කරන්නට ඇතැයි සිතිය හැකි ය.

ඉහත සඳහන් වී ඇත්තේ සංසාරය යන සංකල්පය නිර්මාණය වීමේ දී අනුගමනය කරන්නට ඇතැයි සිතිය හැකි ක්‍රම කිහිපයක් පමණ ය. ඒ පිළිබඳ වඩා සවිස්තර අධ්‍යයනයක් පැරණි ග්‍රන්ථ ඇසුරෙන් කළ යුතු ය. පැරණි ග්‍රන්ථවල සංසාරය නම් සංකල්පය නිර්මාණය වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු ඇති බවක් ඉන් නො කියැවෙයි. එහෙත් ඒ ග්‍රන්ථ ඇසුරෙන් ඒ ඒ අවස්ථාවල, ඒ ඒ යුගවල, සත්වයන් මැරී ඉපදීම පිළිබඳ සමාජයේ තිබූ මත අප ඉහතින් සඳහන් කළ දෑ සමග සංගත වේ දැයි සොයා බැලිය හැකි ය.

අපට මෙහි දී අවධාරණය කිරීමට සිදු වී ඇත්තේ කිනම් ආකාරයකට සිදු වුව ද සංසාරය යන සංකල්පයට මිනිසුන් එක් දිනක දී නොපැමිණි බව ය. සංසාරය යන සංකල්පය හදිසියේ ඕපපාතිකව ඇතිවූවක් නො වේ. එයට ද විකාශයක් ඇත. එමෙන් ම ඒ විකාශය සිදු වී ඇත්තේ ද සංස්කෘතීන් කිහිපයක පමණ ය. අප්‍රිකාවේ ඇතැම් සංස්කෘතීන්හි ද මිනිසුන් නැවත ඉපදීම පිළිබඳ සංකල්පය ඇතත් එසේ ඇත්තේ ඉතා සීමිත පරාසයක ය.

පර්සියාවේ (ඉරානයේ) මේ සංකල්පය තිබී ඇති බව පැහැදිලි ය. විශේෂයෙන් ම යක්ෂ ගෝත්‍රිකයන් අතර ඇතැම් මිනිසුන් මැරී වෙනත් ආත්මවල ඉපදෙන්නේ ය යන සංකල්පය තිබී ඇත. (යක්ෂ ගෝත්‍රිකයන් පර්සියාවෙන් දඹදිවට පැමිණි බවත් ඔවුන් පැමිණ යම් කාලයකට පසුව ආර්යයන් දඹදිවට පැමිණි බවත් අපි විශ්වාස කරමු. මේ සම්බන්ධයෙන් කලකට පෙර පළ වූ අපේ ප්‍රවාද ලිපි කියවන්නේ නම් මැනවි.) ඔවුන්ට ඒ කෙසේ ලැබුණේ ද යන්න ද අධ්‍යයනය කළ යුතු කරුණක් ලෙස ඉතිරි වී ඇත.

අප රටේ ද සිටි යක්ෂ ගෝත්‍රිකයන් අතර මළ යකුන් නෑ යකුන් පිදීමේ චාරිත්‍රයක් තිබී ඇත. අද ද වැදි ගෝත්‍රිකයන් (ඔවුහු ඊනියා ආදි වාසීහු නො වෙති. මෙරට ආදි ගෝත්‍රවලින් ඉතා මෑතක් වන තුරුම සිංහල ජාතියට ඇතුල් නොවී සිටියෝ ඔවුහු ය. එහෙත් දැන් ඔවුහු ද බටහිර නූතනත්වය යටතේ සිංහල ජාතියට ඇතුල් වෙමින් සිටිති.) අතර මළ යකුන් නෑ යකුන් පිදීමේ සිරිත සුළුවෙන් නමුත් පවතියි.වැදි ගෝත්‍රිකයන් හා යක්ෂ ගෝත්‍රිකයන් අතර සුළුවෙන් තැකිය නොහැකි සම්බන්ධයක් ඇති බව පැහැදිලි ය.

යක්ෂ ගෝත්‍රිකයන් පර්සියාවේ සිටිය දී මළ යකුන් ඇදහීමට පුරුදු වන්නට ඇතැයි සිතිය හැකි ය. අද වන විට ඉරානයේ යක්ෂ ගෝත්‍රිකයන් යැයි කිවහැකි ජනතාවක් නොමැති බැවින් එහි මළ යකුන් පිදීමක් නැත. මළ යකුන් නෑ යකුන් ගැන යක්ෂ ගෝත්‍රියන් දැනගත්තේ කෙසේ ද? අපේ ඇතැම් පඬියන් අද සිනහ විය හැකි නමුදු ඇතැම් මිනිසුන් මිය යැමෙන් පසුව අද අප කතාකරන වචනවලින් නම් දේවාත්මවල ඉපිද මෙලොව තම නෑයන්ට දර්ශනය වූ අවස්ථා තිබෙන්නට ඇත. අද ද තම දෙමව්පියන් දේවාත්මවල ඉපිද ඇති අයුරු පෙනෙන දූ දරුවෝ අප රටේ ද සිටිති.

මේ දර්ශනවලට බටහිර විද්‍යාඥයන් සිනහසෙන්නේ හා ඒ නොපිළිගන්නේ ඒ පොදුවේ සියල්ලන්ට දර්ශනය නොවන බැවිනි. එසේ ම මළ නෑයන් ද වෙනත් අය ද දේවාත්මවල ඉපිද ඇති අයුරු දර්ශනය වන්නන් බටහිර විද්‍යාඥයන් විසින් මානසික විකෘතීන්ට භාජනය වුවන් ලෙස හඳුන්වනු ලැබීමේ ප්‍රවනතාවක් පවතියි. එහෙත් බටහිර විද්‍යාඥයන් ප්‍රපංච මෙලෙස සියල්ලන්ට පොදුවේ පෙනිය යුතු යැයි කියන්නේ ඔවුන් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් නො මැතිව ය. බටහිර විද්‍යාවේ නිරීක්ෂණය කෙරෙන, අර්ථකථනය කෙරෙන සියලු ප්‍රපංච සියල්ලන්ට ම එකලෙස නිරීක්ෂණය කළ හැකි දේ ද?

© Prof. Nalin De Silva

මේ සම්බන්ධයෙන් කදිම විස්තරයක් දැනට ටික කලකට පෙර අභාවප්‍රාප්ත පෝල් ෆෙයරාබන්ඩ් මහතා කර ඇත. ඔහු තම අගේන්ස්ට් මෙතඩ් (Against Method) කෘතියෙහි පෙන්වා දී ඇත්තේ බටහිර විද්‍යාවේ බොහෝ දේ නිරීක්ෂණය කිරීමට නම් ඒ සම්බන්ධ පුහුණුවක් කලින් ලබාගත යුතු බව ය. ඒ සඳහා උදාහරණ රාශියක් ඒ මහතා තම පොතෙහි සඳහන් කර ඇත.

බටහිර වෛද්‍යවරුන් ලබාගන්නා එක්ස් කිරණ රූප අර්ථකථනය කිරීම, එනම් ඒ රූප අදාළ අයුරින් නිරීක්ෂණය කිරීම සියලු දෙනාට කළ හැකි කාර්යයක් නො වේ. චිත්‍රය දුටු පමණින් ඉන් පෙන්නුම් කළ හැකි රෝග පිළිබඳ ප්‍රකාශයක් කළ හැක්කේ එක්ස් කිරණ රූප අර්කථනය කිරීමට හැකි අයකුට පමණ ය. එලෙස පුහුණුව ලැබූ අයකුට පෙනෙන දෙය වෙනත් අයකුට නො පෙනෙයි. එවැනි පුහුණුවක් ලබාගැනීමට කාලයක් ගතවන අතර ඒ සඳහා යම් කැපකිරීමක් ද අවශ්‍ය වෙයි. පුහුණුවක් නොලැබූ අයකුට පෙනෙන්නේ ඇටසැකිල්ලක් හෝ වෙනත් එවැන්නක් හෝ පමණකි.

ඇතැම් මිනිසුන්ට පමණක් දේවාත්ම ලබාගත් මියගිය සමහර ඥාතීන් පෙනෙන්නේ නම් ඒ මනෝ ව්‍යාධියක් යැයි කීමට බටහිර විද්‍යාඥයන් ඉක්මන් විය යුතු නැත. එවැනි අය සංසාරයේ ඇති කරගත් පුරුදු හෝ වෙනත් අත්දැකීම් හෝ හේතුවෙන් එලෙස අනෙක් අයට නොපෙනෙන දේවරූප පෙනෙනවා විය හැකි ය. එක්ස් කිරණ රූප කියවන්නන් මනෝ ව්‍යාධිවලින් පෙළෙන්නේ යැයි අනෙක් අය නොකියන්නේ බටහිර විද්‍යාඥයන්ට තම දේශපාලන අධිකාරියත් සමග ලැබෙන උද්ධච්චකම අනෙක් අයට නොමැති හෙයින් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva